මුඩුක්කු සහ පැල්පත් නගා සිටුවීමේ ව්‍යාපාරයෙහි ප්‍රගතියක් පෙන්නුම් කරමින් 1981 වර්ෂය අවසානය වන විට ඒ සඳහා නා.සං.අ. යේ අරමුදලෙන් රුපියල් දශ ලක්ෂ 20·5 ක මුදලක් වැය කොට තිබිණි. නාගරික ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය බල මණ්ඩලවලට සමාජ සංවර්ධන ව්‍යාපාරයන් ගෙන යාම සඳහා අවශ්‍ය අරමුදල් ගොඩ නගා ගැනීමට අනුබල දීමේ පියවරක් වශයෙන් නා. සං. අ. විසින් සංවර්ධන උපදේශක ඒකකයක් ද පිහිටුවන ලදී. එමෙන්ම, නාගරික ප්‍රදේශයන්හි වෙළෙඳ පොළවල්, තානායම්, සිනමා ශාලා වැනි පහසුකම් පෞද්ගලික අංශය ලවා ගොඩ නැංවීමේ අදහසින් වැඩ බිම් කිහිපයක් සංවර්ධනය කිරීම ද නා.සං.අ. විසින් ආරම්භ කරනු ලැබිණ.

ඉදි කිරීම් පිරිවැය සීඝ්‍ර ලෙස ඉහළ නැගීමත්, ණය ලබා ගැනීමේ වියදම් අධික වීමත් නිසා, පෞද්ගලික අංශයේ නිවාස හා ඉදිකිරීම් කටයුතුවල තරමක පසු බැසීමක් දක්නට ලැබිණි. සමස්ථ දිවයිනෙහිම ඉදි කිරීම් කටයුතු නියෝජනය වන අන්දමේ සංයුක්ත දර්ශකයක් නොමැති නිසා පෞද්ගලික අංශයේ ඉදි කිරීම් කටයුතු පිළිබඳ දළ දර්ශකයක් ලෙස කොළඹ නගර සභාව විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැළසුම් සංඛ්‍යාව සැළකීමට සිදු වී ඇත. මෙම දර්ශක යට අනුව, 1979 වර්ෂයේ උපරිම ස්ථානයක් කරා ලඟා වූ පෞද්ගලික අංශයේ නිවාස හා ඉදි කිරීම්වල ප්‍රගතිය 1980 සිට ස්ථාවර මට්ටමක රැඳී ඇති බව 1981 වර්ෂයේ ප්‍රගතිය තුළින්ද සනාථ විය.

කොළඹ නගර සභාව විසින් ඉකුත් වසරේදී අනුමත කරනු ලැබූ නිවාස සැළසුම් 1,134 සමඟ සසඳන විට 1981 දී එම සංඛ්‍යාව 1,140 ක් විය. 1981 දී කළ අනුමත කිරීම් වලින් හරි අඩක්ම පාහේ පැවති නිවාස සඳහා අළුත් අංශ එකතු කිරීම් හා ප්‍රතිසංස්කරණ සිදු කිරීම් ගණයට අයත් විය. මෙහිලා, 1980 වර්ෂය සමඟ සසඳන විට සියයට 16 ක වර්ධනයක් දිස් විය. මේ අතර, නව ඉදි කිරීම්වලට අදළ අනුමත කිරීම් සංඛ්‍යාව සියයට 11 කින් පහත වැටුණු බව නිවාස, තට්ටු නිවාස, වාණිජ සහ කාර්මික ගොඩනැගිලි ආදිය සමස්ථයක් ලෙස ගත් කළ පෙනී යයි. නව ගොඩනැගිලි ඉදි කිරීම් සංඛ්‍යාව අඩු වීම බොහෝ දුරට සිමෙන්ති, යකඩ, වානේ, ලී, වීදුරු ආදී ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාමේ සමුච්චිත ප්‍රතිඵලයක් විය. එමෙන්ම, ගොඩනැගිලි ඉදි කළ හැකි ඉඩම්වල හිඟතාවය සහ කොළඹ නාගරික සීමාව ඇතුළත ඉඩම්වල අධිකතර මිල ගණන් ද මෙම තත්ත්වය වඩාත් තහවුරු කිරීමට ඉවහල් විය. මේ නිසා නේවාසික මෙන්ම කාර්මික අංශයන්හි නව ගොඩනැගිලි බිහිවීම කොළඹ නාගරික සීමාවෙන් ඈත්වී උප නාගරික ප්‍රදේශයන් කරා සංක්‍රමණය වීම සිදු නොවී යයි සිතිය නොහැකිය. 1981 වසරේදී, නව ඉදි කිරීම්වල වර්ධන වේගය පහළ යාමක් පෙනුන නමුත් කොළඹ නාගරික ප්‍රදේශය තුළ පැවති ගොඩනැගිලි පිළිබඳව අළුත් කොටස් එකතු කිරීමේ සහ ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතු ඉහළ යාමෙන් පෙනී යන්නේ ඉඩම් භාවිතය පිරිමසා ගැනීමේත්, පවත්නා පහසුකම් නවීකරණය කිරීමේත් ප්‍රවනතාවයක් පැවති බවය. කෙසේ වෙතත් 1981 වර්ෂයේදී පෞද්ගලික අංශයෙහි නිවාස සහ ඉදි කිරීම් කටයුතු ගැන පිරික්සීමේදී ඉහත වර්ෂ දෙකෙහි මෙම අංශයෙහි පැවති සීඝ්‍ර ක්‍රියාකාරීත්වයෙහි ක්‍රමික අඩු වීමක් විද්‍යාමාන විය.

## සේවා නියුක්තිය

1977 දී හඳුන්වා දෙන ලද ආර්ථික ප්‍රතිපත්තිවල එක් ප්‍රධාන අරමුණක් වූයේ වර්ෂ ගණනක් පුරා ගොඩ නැගුනු සේවා වියුක්ති ප්‍රශ්නයේ සැහෙන බිඳීමක් ඇතිකිරීමය. ආයෝජනය සහ නිෂ්පාදනය පදනම් කරගත් උත්සාහයක් සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම පිණිස ක්‍රම යෙන් පාරිභෝගික සහනාධාර අඩු කිරීම සහ විධිමත් කිරීම පිළිබඳ අවශ්‍යතාවය හමුවේ ශ්‍රී ලංකාව වැනි දුප්පත් රටක ජනතාවගේ ජීවන තත්ත්වය සම්බන්ධයෙන් මෙබඳු ප්‍රතිපත්තීන් මගින් ඇතිකළ හැකිවන ප්‍රබලම බලපෑම නව සහ ඵලදයි සේවා නියුක්ති අවස්ථාවන් බිහි කිරීම මගින් කළහැකි වනු ඇත. මෙම කරුණ අනුව සළකන විට, 1977 දී හඳුන්වා දෙනු ලැබූ ආර්ථික ප්‍රතිපත්තීන් මගින් අංශ රැසකම නව සහ ඵලදයි රැකියාවන් බිහිකිරීමෙහිලා සැලකිය යුතු බලපෑමක් ඇති කොට තිබේ.

1978 සිට 1981 දක්වා වූ සිව් වසර තුළදී විශ්වාසදයි දත්තයන් ලබාගතහැකි සංවිධානය වූ අංශයේ බිහිවුනු නව රැකියා අවස්ථාවන් ගේ මුළු ගණන 3,18,847 ක් විය. වසරකට ශ්‍රම වෙළෙඳපොලට ඇතුළත්වන පුද්ගල සංඛ්‍යා ඇස්තමේන්තුව 1,25,000ක් වශයෙන් සලකන විට දැන් පහතට නැඹුරුවූ ප්‍රවනතාවක් පෙන්නුම් කරන සේවා වියුක්තිය එසේම පවත්වා ගැනීම සඳහා ඉදිරි වසර කිහිපය තුළදී වඩාත් වේගයෙන් රැකියා අවස්ථාවන් ඇතිකළ යුතු වේ. කෙසේ වුවද සංවිධානය වූ අංශය සම්බන්ධයෙන් නව රැකියා අවස්ථාවන් ඇති කිරීම පිළිබඳව මෙතෙක් ලබාගත හැකි සාක්ෂි අනුව පෙනී යන්නේ, 1980 හා සසඳන විට වඩා යහපත් වුවද, නව ආර්ථික ප්‍රතිපත්තීන් හඳුන්වාදුන් මුල් වසර දෙක හා සසඳන විට ඉතා පහත් මට්ටමක පවතින බවය.

1981 දී රජයේ දෙපාර්තමේන්තුවල, අර්ධ රාජ්‍ය ආයතන වල (රාජ්‍ය සංස්ථා සහ ස්ථාපිත මණ්ඩල) සහ සංවිධානය වූ පෞද්ගලික අංශයෙහි (සේවක අර්ථසාධක අරමුදලට දයක වන පෞද්ගලික ව්‍යවසායයන්) සේවා නියුක්තිය 40,622 කින් වැඩිවිය. 1979 සහ 1980 දී මෙම වැඩිවීම පිළිවෙලින් 1,15,000 ක් සහ 18,035 ක් විය. නව රැකියා අවස්ථාවන් පිළිබඳ ඇස්තමේන්තු වලට ආර්ථිකයේ සංවිධානය නොවූ අංශ එනම්, ප්‍රධාන වශයෙන්ම නව ප්‍රතිපත්ති වල බලපෑම සැලකිය යුතු අන්දමින් උද්දීපනය වන සම්ප්‍රදයික කෘෂිකර්මය, ඉදි කිරීම් සහ අනෙකුත් ස්වයං රැකියාවන් ඇතුළත් නොවේ. මෙම අංශ පිළිබඳව දත්ත ලබාගත හැක්කේ සංගණන වර්ෂ සහ නියැදි සමීක්ෂණ පැවති වර්ෂ සම්බන්ධයෙන් පමණකි.

1981 දී රජයේ දෙපාර්තමේන්තුවල සේවා නියුක්තිය ඇස්තමේන්තු ගත 5,389 ක හෝ සියයට 1.1 ක වැඩිවීමක් සිදුවූ බව මහ බැංකුව මගින් පවත්වනු ලබන වාර්ෂික සේවා නියුක්ති සමීක්ෂණයෙන් පෙනී යයි. අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිය 9,077කින් නැතහොත් සියයට 1.2 කින් වැඩිවිය. සේවක අර්ථසාධක අරමුදලින් ලැබුනු තාවකාලික දත්තයන් ගෙන් සහ පෞද්ගලික අංශයේ ආයතන පිළිබඳ නියැදි සමීක්ෂණයකින් පෙනී යන්නේ සංවිධානය වූ පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය සැළකිය යුතු අන්දමින් 26,156කින් එනම්, සියයට 2 කින් ඉහළ නැඟුනු බවය. මෙම වැඩිවීම 1980 දී 3,030 ක් විය.

ආර්ථිකය ව්‍යුහාත්මක වෙනස්කම් වලට මුහුන දෙන කාල සීමාවන්හිදී සේවා නියුක්තිය මැනීම සඳහා සම්ප්‍රදයික මිනුම් දඬු උපයෝගී කර ගැනීම ප්‍රමාණවත් නොවන බව වඩාත් පැහැදිලි වෙමින් පවතී. පසුගිය වසරේ සංවිධානය වූ අංශයෙහි (රජය ඇතුළත්ව) රැකියා අවස්ථාවන් බිහි කිරීමේ හැකියාව රජයේ වියදම් පිළිබඳව පනවන ලද මූල්‍යමය සීමාවන්, බැංකු ණය ප්‍රසාරණය අඩුකිරීම සඳහා දරන ලද උත්සාහය සහ නව ව්‍යාපෘතීන් කෙරෙහි දක්වන ලද අඩු ප්‍රවනතාවය යන සාධකයන්හි බලපෑමට ලක්විය. රාජ්‍ය සංස්ථා රැසක්ම ප්‍රතිපත්තිමය සහ වෙනස්වන වාතාවරණයකට සරිලන ප්‍රති ගැලපුම් සඳහාත්, මෙහෙයවුම් කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහාත් සේවකයන් ඉවත් කිරීමේ වැඩ පිළිවෙලවල් මගින් සේවක සංඛ්‍යාව අඩු කරන ලදී. අනෙක් අතට පෞද්ගලික අංශයේ රැකියා අවස්ථාවන් බෙහෙවින් වැඩිවිය.සංවිධානය නොවූ අංශයේ සේවා නියුක්ති වර්ධන පිළිබඳව පූර්ණ සංඛ්‍යා සැපයී නොමැත. කෙසේ වුවද සංවිධානය වූ අංශයේ සේවක කොටස් වල මූර්ත වැටුප් පහත වැටීමක් පෙන්නුම් කළ 1981 වසරේ දී සංවිධානය නොවූ අංශයේ මූර්ත වැටුප් වැඩිවීම මගින් එම අංශයේ ශ්‍රම ඉල්ලුම ඉතා සීඝ්‍රයෙන් ඉහළ ගිය බව පෙන්නුම් කරයි. වාර්ෂිකව රැකියා අපේක්ෂිත පුද්ගලයන් ගේ සංඛ්‍යාව 1,25,000කින් වැඩිවන බව සලකන විට මෙම නව වර්ධනයන්ගෙන් පෙනී යන්නේ මෙතෙක් පැවති තත්ත්වයට වෙනස්ව, සංවිධානය නොවූ සහ සංවිධානය වූ පෞද්ගලික අංශවල රැකියා බිහිකිරීමේ හැකියාව වඩා විශාල බවයි.

## මිළ

කොළඹ පාරිභෝගිකයන්ගේ මිළ දර්ශකය මගින් මණිනු ලැබූ සාමාන්‍ය මිළ මට්ටමේ ඉහළයාම 1981 වර්ෂයේදී සැහෙන ප්‍රමාණයකින් පහත වැටුණි. 1980 වර්ෂයේදී සියයට 26 කින් වැඩි වූ මෙම මිල දර්ශකය 1981 දී වැඩි වූයේ සියයට 18 කින් පමණි. 1980 දෙසැම්බර් මාසයට වඩා 1981 දෙසැම්බර් මාසයේ දර්ශකය එම වැඩිවීම පෙන්නුම් කරයි. මෙම මිළ වැඩි වීමේ වේගයේ පසුබෑම පිස්කල් ප්‍රතිපත්තියේ අඩු ප්‍රසාරණාත්මක බලපෑමත්, සීමා කරණ ලද මූල්‍ය ප්‍රතිපත්ති සහ ආනයන මිළ ගණන් ඉහළ යාමේ අනුපාතය අඩුවීමත් යන කරුණුවල ඒකාබද්ධ ප්‍රතිඵලය වේ.

භාණ්ඩ අනුව විශ්ලේෂණය කිරීමේදී හෙළිදරව් වනුයේ 1981 වර්ෂය තුළ මිළ දර්ශකයේ වර්ධනයෙන් සියයට 60 ක් දේශීය භාණ්ඩයන්ගේ මිළ වැඩිවීම නිසාත්, පිළිවෙලින් සියයට 35 ක් සහ සියයට 5 ක් ආනයන මිළ වැඩිවීම හා අපනයන ගණයට අයත් දේශීය නිෂ්පාදිත යන්ගේ මිළ වැඩිවීම නිසාත් සිදුවී ඇති බවයි. සහල්, තිරිඟු පිටි සහ පාන් වල ආරෝහන මිළ ප්‍රතිශෝධනයන් දර්ශකයේ වැඩිවීමෙහි සියයට 49 කට හේතුවූ බව දර්ශකය තවදුරටත් විශ්ලේෂණය කිරීමේදී පෙනීයයි. ඉතිරි සියයට 51 ට හේතුවූයේ අනෙකුත් භාණ්ඩවල මිළ ඉහළ යෑමයි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ තොග අලෙවි මිළ දර්ශකයද 1981 වර්ෂය තුළදී අඩු වර්ධන අනුපාතයක් පෙන්වීය. 1980 සියයට 34 ක් වූ වාර්ෂික වර්ධන අනුපාතය හා බලන කල 1981 වර්ෂය තුළදී සියයට 17 ක මිළ ඉහළ යාමක් සිදු විය. තොග අලෙවි මිළ දර්ශකයේ සිදුවූ වර්ධන යෙන් සියයට 64 ක් දේශීය ගණයේ භාණ්ඩවල මිළ ඉහළ යාම නිසා සිදුවී ඇති අතර, සියයට 36ක් ආනයන ගණයේ භාණ්ඩවල මිළ ඉහළ යාම නිසා සිදු විය. දේශීය වශයෙන් නිෂ්පාදිත අප නයන භාණ්ඩවල මිළ ඉහළ නැඟීම 1981 වර්ෂයේදී තොග අලෙවි මිළ දර්ශකයෙහි ඉහළ නැගීම කෙරෙහි එතරම් බලපෑමක් ඇති නොකරන ලදී. භාණ්ඩවල අවසන් භාවිතාව අනුව විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වනුයේ දර්ශකයේ වර්ධනයෙන් සියයට 66 ක් පාරිභෝගික භාණ්ඩවල